**ආණමඩුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනුම් හා ඉවත්කිරීම් වල ශුද්ධ වෙනස රු.191,544 ක් වුවත් 2018 දෙසැම්බර් 31 දිනට ජ'නල් සටහන් අංක 40 මගින් පුස්තකාල පොත් ගිණුමට රු.366,470 ක් ලෙස හර කර තිබුණි. | වර්ෂයේ වෙනස්වීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | සභාවේ පවත්වාගෙන යන පොත්පත් හා උපලේඛන අනුව 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුමේ ශේෂය රු.1,068,339 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ රු.1,157,371 ක් දක්වා තිබීමෙන් ජංගම වගකීම් රු.89,032 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂයේ ඇතුළත් කම්මන්දළුව ගල්කුලම ජල ව්‍යාපෘතියේ (2 අදියර) සඳහා ගෙවිය යුතු මුදල රු.183,940ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 වර්ෂයේ ජූනි 25 දිනැති ගෙවීම් වවුචර් අංක 589 මගින් අත රැඳවුම් මුදල් රු.2,222,681ක් ආපසු ගෙවා තිබූ නමුත් නැවතත් ජංගම වගකීම් යටතේ එය ගිණුම්වල දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව දන්වමි. |
| (v) | සමාලෝචිත වර්ෂය තුල ඉටු නොකරන ලද හරිත අරුණළු ව්‍යාපෘතිය සඳහා වූ රු.15,000ක් හා අසාර්ථක ජීව වායු ඒකකය ඉදිකිරීම සඳහා රු.70,000 ක් වශයෙන් එකතුව රු.85,000 ක් ණයගැතියන් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------------

(i) **ලැබිය යුතු ගිණුම්**

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 05 ක ශේෂ එකතුව රු.25,240,244 ක් වූ අතර, එයින් වර්ෂ 05 ක කාලයක් ඉක්මවූ ශේෂ එකතුව රු.741,723 ක් විය. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ හිටි වරිපනම් ශේෂයෙන් රු.589,457 ක්, හිඟ අක්කරබදුවලින් රු.12,780 ක්, පොදු ණයගැතියන්ගෙන් රු.539,346ක්, හා කර්මාන්ත ණයගැතියෝ රු.10,853,391 ක් 2019 අප්‍රේල් වන විට අයවී ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**(ii) ගෙවිය යුතු ගිණුම්**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 02 ක ශේෂ එකතුව රු.24,663,870 ක් වූ අතර, එයින් වර්ෂ 05 ඉක්මවූ ණයහිමියෝ රු.301,848 ක් විය. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතු වේ. | පොදු ණයහිමි ශේෂයෙන් රු.2,536,832ක් හා කර්මාන්ත ණයහිමි ශේෂයෙන් රු.9,125,514 ක් 2019 අප්‍රේල් වන විට ගෙවා ඇති අතර ඉතිරි ශේෂ කඩිනමින් ගෙවා අවසන් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම** --

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතු වටිනාකම රු.220,794,903 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවසාන ගිණුම් සමග ගිණුම් ශේෂ තහවුරු කෙරෙන උප ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී සියළු විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| 33 රීතිය | සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු ගෙවීම පැහැර හරින තැනැත්තන්ට අයත් දේපළ තහනම් කිරීම සම්බන්ධ කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගත යුතු වේ. | වරිපනම් බල ප්‍රදේශයට අයත් සිතියම නොමැති වීමෙන් මෙලෙස 2018 වර්ෂය තුළ දේපළ තහනම් කිරීමට නොහැකි වූ අතර මේ වන විට අළුතින් බල ප්‍රදේශය සිතියම් ගත කර ඇති අතර කඩිනමින් මෙම දේපළ තහනම් කර හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 25,294,563 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,180,393 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය** -

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්** -

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 5,761 | 3,413 | 2,259 | 7,441 | 5,113 | 5,015 | 3,663 | 6,287 |
| කුලී | 17,698 | 9,017 | 8,831 | 2,025 | 14,159 | 10,840 | 10,384 | 1,839 |
| බලපත්‍ර ගාස්තු | 525 | 1,278 | 1,278 | - | 1,438 | 1,005 | 1,005 | - |
| වෙනත් ආදායම් | 14,755 | 15,219 | 19,440 | 8,442 | 15,325 | 10,377 | 10,205 | 12,663 |
| එකතුව | 38,739 | 28,927 | 31,808 | 17,908 | 36,035 | 27,237 | 25,257 | 20,789 |

❖ රැස් කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වර්ෂවල හිඟ ආදායම් සමග ලැබිය යුතු සමස්ත වරිපනම් හා බදු ආදායමින් සියයට 23 ක් කුලී ආදායමෙන් සියයට 81 ක් හා වෙනත් ආදායම්වලින් සියයට 70ක් සමාලෝචිත වර්ෂයේදී රැස් කර තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ පසුගිය වර්ෂ වල හිඟ ආදායම් අය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වර්ෂයේ රු.6,287,000 ක් වූ වරිපනම් හා බදුවල හිඟය | හිඟ වරිපනම් බදු කඩිනමින් | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පැවති හිඟ වරිපනම් |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු.7,741,031 ක් දක්වා සියයට 18 කින් වැඩිවී තිබූ අතර සභාව විසින් වරිපනම් හා බදු එකතු කිරීම පිළිබඳ වගකීම නිසි ලෙස ඉටුකර නොතිබුණි. | අයකර ගත යුතු වේ. | වලින් රු.589,456 ක් මේ වන විට අයකරගෙන ඇති බව කාරුණිකව දන්වමි. ඉදිරියේදි ඉතිරි හිඟයන්ද, දේපළ තහනම් කර අයකර ගන්නා බව කාරුණිකව දන්වමි. |

**2.2.4 කුලී**

--------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාල හිඟ බදු කුලී රු.539,174ක් සහ 2015 වර්ෂයට පෙර සිට හිඟව පවතින රු.28,800ක් වූ කඩ කාමර කුලී අයකරගෙන නොතිබුණි. | සුවිශේෂ අවධානය යොමු කර කඩිනමින් අයකර ගත යුතු වේ. | රු.539,174 ක හිඟ බදු කුලිය අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති අතර, 2015 වර්ෂයට පෙර සිට පවතින රු.28,800 ක කඩ කාමර කුලී අය කර ගැනීමට නොහැකි නිසා ඒවා කපා හැරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.7,343,502ක් වූ උසාවි දඩ සහ රු.11,695,742 ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | තව දුරටත් අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ උසාවි දඩ වලින් මේ වන විට රු.4,381,167 ක් හා හිඟ මුද්දර ගාස්තුවලින් රු.5,600,000 ක් අය වී ඇති අතර ඉතිරියද ඉක්මනින් අය කරගන්නා බව කාරුණිකව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ 2018 දෙසැම්බර් 31 දින වන විට කාරණා 29 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව සභාවට අදාළ අතුරු ව්‍යවස්ථා වැළඳ ගත යුතු වේ. | ඉදිරියේදි අවශ්‍යතාවය අනුව අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) 2018 වාර්ෂික සංවර්ධන සැලැස්මේ සඳහන් ඇස්තමේන්තු මුදල රු.997,835 ක් වූ ක්‍රියාකාරකම් 04 ක් ඉටුකර නොතිබුණි. | වාර්ෂික සංවර්ධන සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | බස් නැවතුම්පළ සඳහා වෙන් කර ඇති රු.877,835 ක ප්‍රතිපාදන වලින් රු.755,670 ක් වැය ශීර්ෂ මාරු කර ප්‍රයෝජනයට ගෙන ඇති අතර, ඉතිරි ක්‍රියාකාරකම් 03 සිදු කර නොමැත. 2019 වර්ෂයේ සිට එවැනි අඩුපාඩු ඇති නොවන පරිදි කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ii) 2018 වාර්ෂික සංවර්ධන සැලැස්මේ ක්‍රියාකාරකම් 05ක ප්‍රගතිය සියයට 3 සිට 29 දක්වා පරාසයක පැවතුණි. | වාර්ෂික සංවර්ධන සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට ක්‍රියා මාර්ග ගත යුතු වේ. | 2019 වර්ෂයේ ණය හිමි ලේඛනයේ ඇතුළත් කර පෙර පාසැල් අළුත්වැඩියාව හා නඩත්තුව, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ළමා අපචාර හා අපයෝජන වැළක්වීම පිළිබඳ වැඩසටහන් සඳහා වැය කර ඇති අතර, ඉදිරියේදි මෙවැනි අඩුපාඩු ඇති නොවන පරිදි කටයුතු කරන බව දන්වමි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ සභා බල ප්‍රදේශයේ දෛනිකව ටොන් 2.5 ක පමණ කසළ ප්‍රමාණයක් එකතු වන අතර එයින් කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා දිනකට කසළ ටොන් 1.8 ක් පමණ යොදාගනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදිත සහ විකුණන ලද පොහොර ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 8260 ක් වූ අතර ආදායම රු.82,600 ක් විය. ඉකුත් වර්ෂයේ ආදායම සමග සැසඳීමේදී රු.10,400 ක අඩුවීමක් සිදුවී ඇත. | කසළ කළමනාකරණය නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. | සභා භූමියේ පැවති කොම්පෝස්ට් අංගනය සභාවෙන් පිටත ගුරුපොකුණ ප්‍රදේශයට රැගෙන යාමේදි ඒ අතරතුර යම් කාල පරිච්ජේදය සඳහා කොම්පෝස්ට් සකස් කිරීමට නොහැකි විය. එම කාලය තුළ අදායම යම් ප්‍රමාණයකින් අඩු වූ බවත් දන්වමි. දැන් අලවියද ඉහළ ගොස් ආදායම වැඩි වී ඇති බව කාරුණිකව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක ලෙස සෞඛ්‍ය ආරක්ෂිත ජල පහසුකම් ඇතිකිරීම, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, මාර්ග ප්‍රතිසංස්කරණය, ජනතාවගේ සෞඛ්‍ය කටයුතු නගා සිටුවීම හදුනාගෙන තිබුණද එම ඉලක්ක කරා ළගාවීමේ ප්‍රගතිය සියයට 75 ට අඩු මට්ටමක පැවතුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ලඟා වීමට කටයුතු සැලසුම් කලද භෞතික හා මානව සම්පත් හිඟකම මත මෙලෙස ප්‍රගතිය 75% කට අඩු මට්ටමක පැවති බව දන්වමි. ඉදිරියේදි එහි ප්‍රගතිය ඉහළ නැංවීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ ද්විතියික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 13 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 10 ක් පැවති අතර අනියම්/ ආදේශක තනතුරු සඳහා 13 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව සේවයේ යොදවා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 07ක් සඳහා බඳවාගැනීම් සිදුකර ඇති අතර අනියම්/ආදේශක සේවකයින් 13 දෙනකු අතිරික්ත ලෙස සිටින අතර අවශ්‍යතාවය මත කොම්පෝස්ට් අංගනයේ කටයුතු සඳහා මෙම සේවකයින් බඳවාගෙන ඇත. එම තනතුරු ස්ථිරව ඇති කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව වැඩිදුරටත් දන්වමි. |
| (ආ) | **සේවක ණය**<br>වැඩ තහනමට ලක්වූ සේවකයෙකුගේ රු.2,500 ක ණය ශේෂයක් සහ විශ්‍රාම ගිය සේවකයෙකුගේ රු.9,441 ක ණය ශේෂයක් 2012 වර්ෂයේ සිට අය නොවී පැවතුණි. | අයවිය යුතු සේවක ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ණය ශේෂයන් අය කර ගැනීම සඳහා ලිඛිතව දන්වා ඇති අතර ඒ අනුව ඉදිරියේදි අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**3.3 ප්‍රසම්පාදනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති අතර නැවත මෙවැනි අඩු පාඩු ඇති නොවන පරිදි කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් වැය විෂයයන් 08 ක් සඳහා ප්‍රතිපාදිත රු.1,225,064 ක් වූ මුදලින් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. | ප්‍රතිපාදිත මුදල්වලින් උපරිම ප්‍රතිලාභයක් ලැබෙන ලෙස කටයුතු කළ යුතු වේ. | භාණ්ඩ මිළදී ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනැගීම, සුභසාධන අවශ්‍යතා සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම, තනතුරු පුරප්පාඩු නිසා වැටුප් නොගෙවීම යන කාරණා නිසා මුදල් ඉතිරි වී තිබුණි. |